NATIONAL
DANGEROUS DRUGS
CONTROL BOARD
www.nddcb.gov.lk

# NDDCB NEWS LETTER

VOLUME 37

JULY - SEPTEMBER

NATIONAL DANGEROUS DRUGS CONTROL BOARD

MINSTRY OF PUBLIC SECURITY

## Vision

" Build a Drug Free Healthy and Secured Nation"

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

"Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals"

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6**

**Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**FB – National Dangerous Drug Control Board**



**සැකසුම**

- තුෂාරි වලස්මුල්ලගේ

- **පරිගණක පිටු සැකසුම**

  තිළිණ ප්‍රියංකර




# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ............

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය 1984 අංක 11 දරන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල පනත යටතේ ස්ථාපනය කර ඇත.

මත්ද්‍රව්‍ය අනිසි භාවිතය ජාත්‍යන්තරව පාලනය කිරීම සඳහා සකස් වූ 1961 මාදක ගණයේ මත්ද්‍රව්‍ය සඳහා වූ කේවල සම්මුතිය (Single Convention on Narcotic Drugs 1961) 1971 මනෝවර්ථක ද්‍රව්‍ය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UN Convetion on Psychotropic Substances) සහ 1988 එක්සත් ජාතීන්ගේ මාදක හා මනෝවර්ථක නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත (UN Convetion Against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances 1988) යන ජාත්‍යන්තර සම්මුතීන් ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මාදක ඖෂධ හා මනෝවර්ථක ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධ කේන්ද්‍රීය ජාතික ආයතනය වශයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරනු ලබයි.

## මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා නිවාරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සමීක්ෂණ සහ වෛද්‍ය, සමාජ, නෛතික, ආර්ථික සහ සංස්කෘතික කාරනා සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.
- මත්ද්‍රව්‍ය සම්න්ධයෙන් රසායනික විශ්ලේෂණ සිදු කිරීම මගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක නිර්දේශයන් ලබාදීම සහ පූර්ව රසායන ද්‍රව්‍ය පාලනය කිරීම.
- මත්ද්‍රව්‍ය පාලන කටයුතු වල නිරත ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම.

### මණ්ඩලය යටතේ ක්‍රියාත්මකවන ප්‍රධාන අංශ

- පර්යේෂණ අංශය
- ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශය (මධ්‍යස්ථාන 04)
- නිවාරණ අධ්‍යාපන හා පුහුණු අංශය
- ජාතික මාදක රසායනාගාරය
- බාහිර සේවා අංශය
- නමෝදිෂ්ට හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන අංශය
- පූර්ව රසායන අධිකාරිය

National Dangerous Drugs Control Board



## සභාපතිතුමාගේ පණිවුඩය

වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන මත්ද්‍රව්‍ය භාවිතය, ඇබ්බැහිය, ජාවාරම හා විකිනීම සම්බන්ධ අර්බුදකාරී වාතාවරණය හමුවේ මත්ද්‍රව්‍ය නිවාරණය, පාලනය ප්‍රතිකාර හා පුනරුත්ථාපනය යන ක්ෂේත්‍රයන්හි නව මානයන් විවෘත කර ගැනීමේ සාධනීය ක්‍රමවේදයක අවශ්‍යතාවය පැනනැගී ඇත. එම කටයුත්ත උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කණ්ඩායම් හැඟීමෙන් යුක්තව සිය දායකත්වය නොමසුරුව ලබා දෙමින් සිටී. විශේෂයෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව පැනනගින නව ප්‍රවණතාවන්, මෙන්ම මත්ද්‍රව්‍යයෙහි ඍජු ඉලක්ක බවට පත් විය හැකි අවධානම් කණ්ඩායම් පිළිබඳවත් යාවත්කාලීන වන තොරතුරු කෙරෙහි මණ්ඩලය නිරන්තරව සිය අවධානය යොමු කර ඇත. මණ්ඩලයේ සෑම තාක්ෂණික අංශයක්ම සිය විෂය දැනුම හා අද්දැකීම් මත පදනම් වෙමින් එම තත්වයන් ආමන්ත්‍රණය කිරීම කෙරෙහි නිවැරදි හා ක්‍රමවත් ප්‍රායෝගික වැඩපිළිවෙල සකසමින් සිය වගකීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී. යම් ගැටලුවක් කාලය හා සමාජ තත්වයන් මත වෙනස් වීම් වලට භාජනය වෙමින් එහි තීව්‍රත්වය වැඩි වෙමින් පවතින විට ගැටලුවට එරෙහිව හා ඊට විසඳුම් සෙවීමට වගකීම් දරන්නන්ද සිය කාර්යයන් ඊට අනුරූපී ලෙස සකස් කර ගත යුතු වන අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් නිකුත් කරන මෙම කාර්තුමය ලේඛනයෙහි අන්තර්ගය ඊට මනාව සාක්ෂි සපයන බව කිව යුතුය. මතින් නිදහස් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම කෙරෙහි සිය වෘත්තීය වපසරිය තුළ ඔබ දක්වන සහයෝගය පිළිබඳව කෘතඥපූර්වක වන අතරම මණ්ඩලයෙහි අරමුණු ඉටුකිරීම කෙරෙහි ඔබගේ නොමද දායකත්වය නිරන්තරවම අපේක්ෂා කරමි.

**සභාපති**

**ශාක්‍ය නානායක්කාර**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**



# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

1984 අංක 11 දරණ අන්තරායකර ඖෂධ පාලනය කිරීමේ පනත ප්‍රකාරව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය පිහිටුවා ඇති අතර ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය නිවාරණය පාලනය ප්‍රතිකාර හා පුනරුත්ථාපන යන ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධව ක්‍රියාත්මක වන ප්‍රධානතම ජාතික ආයතනය වේ. එම අරමුණු හා ඊට අදාල කාර්යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි විධිමත් පරිපාලන ව්‍යුහයක් ආයතනය තුළ පවතින අතර ජාතික ආයතනයක් වශයෙන් මත්ද්‍රව්‍ය සම්බන්ධව මහජනතාවගේ ගැටලු ඍජුව හා වක්‍රව ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අදාල යාන්ත්‍රණය ආයතනය තුළ ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ ඇම්පිටමින් කාණ්ඩයේ මත්ද්‍රව්‍යයක් ලෙස මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධව වාර්ථා වන සිදුවීම් ප්‍රමාණය වාර්ෂිකව වැඩි වෙමින් පවතින අතර එම ප්‍රවණතාවය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කිරීම මෙන්ම නිවාරණ හා ප්‍රතිකාර පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් පවතින දැඩි ඉල්ලුම වෙනුවෙන් අදාල ක්‍රියාමාර්ග ගැනීම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධව කලින් කලට පැනනගින තත්වයන් ආමන්ත්‍රණය කිරීම මෙන්ම මත්ද්‍රව්‍ය පාලනය සම්බන්ධව අදාල වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, නීති පද්ධතිය යාවත්කාලීන කිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම, අදාල රේඛීය අමාත්‍යංශය සමග ඍජුව සම්බන්ධ වීම ආදී පරිපාලනමය කාර්යයන් හරහා මණ්ඩලයේ කාර්යභාර්ය වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට මණ්ඩලය බැඳී සිටී. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන මෙම කාර්තුමය ලේඛනය හරහා මණ්ඩලය විසින් එම කාර්යයන් ඉටු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගයන් මෙන්ම ඊට කාර්ය මණ්ඩලය තුළ වන දැනුම හා විභවය පෙන්වනු ලබයි. මතින් නිදහස් ශ්‍රී ලංකාවක් කරා ගමන් කිරීමේදී ඔබ ඊට දක්වන සහයෝගය අගය කරමි.

**ලක්ෂාන් ද සොයිසා**
**අධ්‍යක්ෂ ජනරාල්**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

## National Consultation Meeting for Sri Lanka National Policy for Prevention and Control of Drug Abuse

The National Dangerous Drugs Control Board successfully concluded the Consultation Meeting for reviewing the Sri Lanka National Policy for Prevention and Control of Drug Abuse at Hotel Kingsbury, Colombo on 04th August 2023. The Secretary to the Ministry of Public Security, the dignitaries from The Japan International Cooperation Agency (JICA) – Our collaborative partner, representatives from UNODC, and many other distinguished participants representing relevant stakeholder agencies graced the event. Four main pillars of the National Policy such as Demand Reduction, Supply Control, Coordination & Cooperation, Research and Information Management, and Monitoring and Evaluation were conversed and deliberated, during each session and several observations/recommendations were made to be incorporated into the National Policy.

Over 80 stakeholders representing ministries, district/divisional secretariats, and government and non-governmental agencies/institutes/organizations were engaged in sharing insights to make recommendations. It was certainly a platform that enabled making productive recommendations for finalizing the National Policy for fruition. National Policy for Prevention and Control of Drug Abuse in Sri Lanka adopt broader approaches within the context of people-centered approaches, with evidence-based and development-sensitive programs focusing particularly on the root causes behind drug trafficking, abuse, and their negative consequences such as poverty, social exclusion, inequality, crime development, promoting the protection of and respect for human rights, inclusive economic growth, social development, environmental protection to benefit all ensuring freedom, peace and security, the rule of law, good governance, gender equality, women's empowerment and different approaches depending on national circumstances.

We were blessed to successfully conclude the Consultation Meeting for the Sri Lanka National Policy for Prevention and Control of Drug Abuse in collaboration with JICA.








# සංවිධානාත්මක අපරාධවලට එරෙහි ප්‍රතිචාර ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණවල නියැලීම සහ හවුල්කාරීත්වය වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය නිවාරණය හා පුනරුත්ථාපන කාර්යයට අදාළ පාර්ශවකරුවන් සඳහා මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය UNODC මගින් සංවිධානය කළ මත්ද්‍රව්‍ය සහ සංවිධානාත්මක අපරාධවලට එරෙහි ප්‍රතිචාර ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණවල නියැලීම සහ හවුල්කාරීත්වය වැඩිදියුණු කිරීමේ වැඩසටහන COURT YARD by MARRIOTT හෝටල් පරිශ්‍රයේදී පවත්වන ලදී. තවද UNODC මූල්‍ය ප්‍රතිපාදන මත කුසලතා පාදක සවිමත් පවුල් නිර්මාණය කිරීම උදෙසා වූ දෙදින (2023.09.06- 2023.09.07) වැඩමුළු ද එම පරිශ්‍රයේ දී පවත්වන ලදී.

මෙහිදී පවුල තුළ ආරක්ෂාකාරී සාධක වර්ධනය කර අවධානම්කාරී සාධක අවම කිරීම අරමුණු කරගනිමින් ශක්තිමත් පවුල් ප්‍රජාවක් ගොඩනැගීම උදෙසා ප්‍රායෝගික පුහුණුව නිවාරක අධ්‍යාපන පුහුණු අංශයේ නිලධාරින්, බාහිර සේවා අංශයේ නිලධාරීන් වෙත මෙන්ම නිවාරණ ක්ෂේත්‍රයේ නියැලෙන රජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සංවිධාන නිලධාරින් වෙත ද ලබාදෙන ලදී.






## නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වලට අදාලව මෙම කාල වකවානුව තුළ සිදු කරනු ලැබූ වැඩසටහන්**

### කාර්යය මණ්ඩල ධාරිතා පුහුණු වැඩසටහන

මත්ද්‍රව්‍ය නිවාරණ සහ පුනරුත්ථාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු නිලධාරීන් හට ප්‍රතිකාර පුනරුත්ථාපනය සහ නිවාරණ උපාය මාර්ග පිළිබඳවත්, පසුරැකවරණ සේවාවන් සඳහා වන ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳත්, නිවැරදි දැනුම සහ අවබෝධය යාවත්කාලීන කිරීමේ අරමුණින් කාර්යය මණ්ඩල ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් තුනක් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් මෙම කාලවකවානුවේ දී දියත් කරන ලදී. එය තලංගම පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ දී පවත්වන ලද අතර නිවාරක අධ්‍යාපන හා පුහුණු, ප්‍රතිකාර හා පුනරුත්ථාපන, බාහිර සේවා අංශයන් හි නිලධාරීන් මේ සඳහා සම්බන්ධ වූහ. මණ්ඩලයේ සම්පත්දායකයින් මෙන්ම මත්ද්‍රව්‍ය නිවාරණ ක්ෂේත්‍රයේ ක්‍රියාකාරී බාහිර සම්පත්දායකයින් ද මේ සඳහා සම්බන්ධ කරගන්නා ලදී.






කාර්යය මණ්ඩල ධාරිතා පුහුණු වැඩසටහන යටතේ පස් දින පුහුණු වැඩමුළුවක් සේනපුර තෘතීක හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයේ දී 2023.09.11 දින ආරම්භ කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ මත්ද්‍රව්‍ය උපදේශන වෘත්තිකයින් හට  මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමිකතා සඳහා මෙන්ම ප්‍රතිකාරාත්මක මත්ද්‍රව්‍ය උපදේශනය සහ මත්ද්‍රව්‍ය සඳහා  වූ අඛණ්ඩ රැකවරණය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීමය.  මේ තුළින් සේවාලාභීන් වෙත ඵලදායි කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකිවේ. මෙම වැඩසටහන  සඳහා  උපදේශකයින් සහ සහය උපදේශකයින් 37 දෙනෙකු  සහභාගී වූ අතර මෙම වැඩසටහන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ  නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් දියත් කල අතර වැඩසටහන සංවිධානය සහ සම්බන්ධීකරණය පුනරුත්ථාපන කාර්යාංශය මඟින් සිදුකරන ලදී.












## මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම

මනා පෞරුෂයකින් සහ සෞඛ්‍ය සම්පන්න භාවයකින් යුත් අනාගත පුරවැසියන් ලෙස දරුවන් සමාජගත කිරීමේ ප්‍රධානතම කාර්යභාර්යක් පාසලට ද හිමි ව ඇත. දරුවන් එම තත්ත්වයට ගොඩනැගීම සඳහා බාධාවක් වන කරුණු අතර මත්ද්‍රව්‍ය ද එක් ප්‍රධාන සාධකයක් වේ.

එබැවින් පාසල් සිසු සිසුවියන් වෙත ගුණාත්මක හා ප්‍රමිතිගත මත්ද්‍රව්‍ය නිවාරණ මැදිහත්වීමක අවශ්‍යතාවය පැන නැගී ඇත. මෙහිදී විශේෂයෙන්ම පාසල් පද්ධති වෙත පැමිණෙන විවිධ ආයතන මඟින් විවිධාකාරයෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පවත්වන අතර ඒවායේ ප්‍රමිතිය පිළිබඳ ගැටලුකාරී තත්වයක් උද්ගත වී ඇති බැවින් එයට පිළියමක් වශයෙන් අධ්‍යාපන අමාත්‍යංශය පාසල් පද්ධතිය තුළ ක්‍රියාවට නැංවිය හැකි පොදු නිවාරණ වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීමට සැළසුම් කරන ලදී .

ඒ අනුව විදුහල්පති ,ගුරුවරුන් ,සිසුන් සහ පාසල් ප්‍රජාව නිවැරදිව දැනුවත් කිරීම අරඹයා මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමට පියවර ගත් අතර මෙම කාර්යය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙන ලදී.







## පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

රටක ජීවනාලිය බඳු තරුණ පරපුර එම රටේ වර්තමානය හා අනාගතයේ ශක්තිමත් පවුරයි. මත්ද්‍රව්‍ය නිවාරණයට සක්‍රීය දායකත්වයක් ලබාදී ඇති ප්‍රබලම කණ්ඩායම බැවින් ඔවුන් සඳහා ප්‍රායෝගික, සාක්ෂි මත පදනම් වූ විද්‍යාත්මක වැඩසටහන් නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශය විසින් වාර්ෂිකව දියත් කරනු ලැබේ.

ඒ අනුව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ජාතික තරුණ සේවා සභාව මගින් එක් දිස්ත්‍රික්කයකින් නියෝජිතයින් හතර දෙනකු බැගින් සම්බන්ධ කරගනිමින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ තෙදින වැඩසටහනක් කලාවැව මිරිදිය ධීවර පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. එය 2023.08.29 දිනෙන් ආරම්භ කල අතර මෙම වැඩසටහන සිංහල හා දමිළ මාධ්‍යයන් ඔස්සේ පවත්වන ලදී.

මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා , නිවාරක හා පුහුණු අංශයේ සහකාර අධ්‍යක්ෂ ප්‍රදීප් කොහොලනේගෙදර මහතා ඇතුළු එම අංශයේ නිලධාරීන් විසින් මෙම වැඩසටහන දියත් කරන ලදී.










# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ තත්ත්වය සහ නව ප්‍රවණතා විවිධ මූලාශ්‍ර හා නිර්නායක ඔස්සේ අධීක්ෂණය සහ මිනුම් කරනු ලබන අතර විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ සැපයුම පාලනය කිරීමේ හා ඉල්ලුම අවම කිරීමේ උපාය මාර්ග හරහා නිවාරණය හා පාලනය කරනු ලබයි. වීථි මට්ටම තුළ මත්ද්‍රව්‍ය සුලභතාවය, අත්අඩංගුවට පත්වන පුද්ගල සංඛ්‍යාව, නව මත්ද්‍රව්‍ය ප්‍රභේදවල ව්‍යාප්තිය, වාර්තාවන මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධ සිද්ධීන් වැනි නිර්ණායක මෙන්ම ප්‍රතිකාර සේවාවන්ට වාර්තාවන පුද්ගල සංඛ්‍යාව, බන්ධනාගාරගත වන පුද්ගලයින් සංඛ්‍යාව වැනි නිර්ණායක හරහා මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ හඳුනාගැනීමක් කළ හැකිය. මෙම අත්පොත හරහා එවැනි නිර්ණායක යටතේ කාලීන සංඛ්‍යාලේඛන විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත.

## මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම්


2022 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වලට අදාල දත්ත විශ්ලේෂණය කිරීමේදී සංඛ්‍යාත්මකව වැඩිවීමක් හඳුනාගත හැකිය. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 152,979 කි. එය 2021 වර්ෂය හා සසඳන කල 36%ක වැඩිවීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවටපත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා 45.6% ක් ද, ගංජා ආශ්‍රිත වැරදි සඳහා 35% ක් සහ මෙතැම්පිටමින් වැරදි සඳහා 14.8% ක් ද වේ. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතෙන්ද (59%), වයඹ පළාතෙන් 10% ක් ද, දකුණු පළාතෙන් 08% ක් ද වාර්තා වී ඇත. අත්අඩංගුවටපත් මුළු සංඛ්‍යාවෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් 41%ක්ද, ගම්පහ දිස්ත්‍රික්කයෙන් 12%ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 06% ක් ද



ලෙස වාර්තා වී ඇත. 2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවටපත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාවය වයස අවුරුදු 15-64 අතර ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට පුද්ගලයන් 751 දෙනෙකි.


2021 වර්ෂය හා සැසඳීමේදී හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් සහ ගංජා සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වීම් වල සංඛ්‍යාත්මක වැඩිවීමක් හඳුනාගත හැකිය. මෙතැම්පිටමින් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් ක්‍රමිකව වැඩිවීමේ ප්‍රවණතාවයක් හා භාවිතයෙහි ප්‍රවණතාවයක් හඳුනාගත හැකිය.

මත්ද්‍රව්‍ය වැටලීම් වලදී අත්අඩංගුවටගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය අනුව 2022 වර්ෂයේදී හෙරොයින් කිලෝ ග්‍රෑම් 1,677 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර 2021 වර්ෂයට සාපේක්ෂව අත්අඩංගුවට පත්වූ ප්‍රමාණවල සුලු වැඩි වීමක් හඳුනාගත හැකිය. ගංජා සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් විමර්ශනය කිරීමේදී 2022 වර්ෂය තුළදී ගංජා කිලෝග්‍රෑම් 17,607 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙතැම්පිටමින් ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවටගත් පුද්ගල සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කළද අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණ වල සැළකිය යුතු වර්ධනයක් හඳුනාගත නොහැකිය.




**ගංජා**

2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්වලින් වැඩි ප්‍රමාණයක් (53,579) ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වී ඇති අතර ගංජා වැටලීම් වැඩි වශයෙන් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි (12%). 2022 වර්ෂයේ දිවයින පුරා අත්අඩංගුවට පත්ව ඇති ගංජා ප්‍රමාණය කිලෝ ග්රෑම් 17,607 ක් වේ. බස්නාහිර පළාතෙන් ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් වලින් 42%ක් වන අතර දකුණු පළාතෙන් 12% ක් ද, වයඹ පළාතෙන් 10% ක් ද, මධ්‍යම පළාතෙන් 06% ක් ද වාර්තා වේ. 2022 වර්ෂයේ ගංජා ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වීමේ ප්‍රවණතාවය අවුරුදු 15-64 අතර ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 263 දෙනෙකි.





**හෂීස්**

2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාලේඛන දත්ත අනුව හෂීස් සම්බන්ධ සිද්ධීන් 197 ක් වාර්තා වී ඇති අතර පුද්ගලයින් 197 දෙනෙක් අත්අඩංගුවට පත්ව ඇත. 2022 වර්ෂයේ හෂීස් කිලෝග්‍රෑම් 3.531 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර හෂීස් සම්බන්ධ සිද්ධීන් වලින් 74% ක් බස්නාහිර පළාතෙන් වාර්තා වී ඇත.


**හෙරොයින්**

2022 වර්ෂයේ හොරොයින් කිලෝග්රෑම් 1677 ක් නීතියේ රැහැනට හසුවී ඇති අතර පුද්ගලයන් 69,688 ක් අත්අඩංගුවට පත්වී ඇත. හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2021 වර්ෂය හා සසඳන කල 2022 වර්ෂයේදී 38%කින් වැඩිවී ඇත. 2022 වර්ෂයේ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රවණතාවය අවුරුදු 15-64 අතර ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 248 දෙනෙකි.




**මෙතැම්පිටමින්**

2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේදී මෙතැම්පිටමින් සඳහා අත්අඩංගුවටපත් පුද්ගල සංඛ්‍යාවෙහි වැඩිවීමේ ප්‍රවණතාවයක් හඳුනාගත හැකි අතර අත්අඩංගුවටපත් මෙතැම්පිටමින් ප්‍රමාණයෙහි වැඩිවීමක් හඳුනාගත නොහැකිය. 2022 වර්ෂයේදී මෙතැම්පිටමින් කිලෝ ග්‍රෑම් 283 ක් සහ ග්‍රෑම් 873 ක් සමග පුද්ගලයින් 22,631 දෙනෙක් නීතිය ක්‍රියාත්මක කරන අංශවල අත්අඩංගුවටපත්ව ඇත. පසුගිය වසර දෙක ඇතුළත මෙතැම්පිටමින් භාවිතය සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බව අත්අඩංගුවටපත්වීම් පිළිබඳ වාර්තා තුළින් පැහැදිළි වේ. 2022 වර්ෂයේ මෙතැම්පිටමින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්වල ප්‍රවණතාවය අවුරුදු 15-64 අතර ජනගහණයෙන් ලක්ෂයකට පුද්ගලයන් 111 දෙනෙකි.




**ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන්**

2022 වර්ෂයේ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා පුද්ගලයින් 1,996 දෙනෙක් ප්‍රතිකාර සේවාවන් ලබාගෙන ඇත. එම සේවාලාභීන්ගෙන් 746 (37.4%) දෙනෙක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් ද, 67 (3.4%) බන්ධනාගාර ප්‍රතිකාර වැඩසටහනින් ද, 355 (17.8%) රාජ්‍ය නොවන සංවිධානවලින් ද, 821 (41.1%) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් ද ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් ලබාගෙන ඇති අතර එම සේවාලාභීන්ගෙන් බහුතරයක් (26.3%)ක් කොළඹ දිස්ත්‍රික්කයෙන් ආයතනගත වූවන් ය. මධ්‍යස්ථානගත ප්‍රතිකාර සේවාවන් වලට අමතරව ප්‍රජා මට්ටමින් ප්‍රජා පාදක ප්‍රතිකාර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.




ප්‍රතිකාර ලබාගත් පුද්ගලයන්ගෙන් 34%ක් අවුරුදු 30 හෝ ඊට වැඩි පුද්ගලයින් වෙති. 2021 වර්ෂය හා සැසඳීමේදී 2022 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා යොමුවූ සේවාලාභීන් සංඛ්‍යාව 17% කින් වැඩි වී ඇත.

## බන්ධනාගාර ගතවීම්

2022 වර්ෂයේදී බන්ධනාගාරගතවූ මුළු පුද්ගලයන් සංඛ්‍යාව 30,331 කි. ඔවුන් අතුරින් විෂ මත්ද්‍රව්‍ය වැරදි සඳහා පුද්ගලයින් 18,484 දෙනෙක් බන්ධනාගාරගතවී ඇත. එය මුලු බන්ධනාගාරගතවීම් වලින් 60.9% ක් වේ. 2022 වර්ෂය තුළ ගංජා සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 2,656 (13.9%) ක්ද හෙරොයින් සම්බන්ධ වැරදි සඳහා පුද්ගලයන් 12,913 (67.6%) ක්ද බන්ධනාගාරගතවී ඇත.

**හිරුනි වත්සලා - පර්යේෂණ නිලධාරී**

# National Narcotics Laboratory

## Scientific support to effective enforcement of law against production, smuggling, trafficking sale and use of illicit drugs

The National Narcotics Laboratory (NNL) conducted research based scientific analysis for identification of suspected drugs of abuse available in Sri Lanka for investigation, operational, intelligence and court purposes. During the period of July to September, 2023, NNL analyzed twelve (12) no of samples with respect to two (06) cases were analyzed, research based analysis were conducted for these samples for the identification of narcotic drugs and psychotropic substances and other adulterants therein.

The results of these analyses have been shared with other national institutions and agencies, and are being used for various investigations, analysis of drug trends; strategic analysis, policy making, regulatory needs, legislation and reducing health hazards. This information has a significant impact on the country's law enforcement, crime prevention and health policy. The analytical reports issued with respect to the court orders of Magistrate's courts are being used for the legislative measures to be taken with respect to prosecution related cases.

## Scientific Training Programs for Strengthening Drug Law Enforcement capacities

Scientific training programs on Drugs and Drug Law Enforcement were conducted and the training objectives are, Introduction to Sri Lanka National Policy for Prevention and control of drug abuse, global, Regional and National drug problem, types and classification of drugs of abuse, addressing emerging challenges internet drug trafficking and delivery through postal services, legislation pertaining addressing emerging threats, identification of drugs using field drug test kits. The National Narcotics Laboratory conducted ten (10) capacity building programs for 382 no of law enforcement officers.

## Work place drug testing program

The consumption of drugs during working hours implicates the health and safety of the individual and others as well as the productivity which has an impact on the country.

Therefore to mitigate these risks, the NNL has introduced a drug free policy for workplaces in coordination with BOI companies and has expanded the service of NNL on workplace drug testing for the presence and/or absence of the metabolites of drugs of abuse. NNL conducted 181 tests to detect the presence of drugs controlled under the *Poisons Opium and Dangerous Drugs Ordinance* and *Conventions against Illicit Traffic in Narcotic Drugs and Psychotropic Substances Act, No. 01 of 2008* therein for individuals and institutions seeking "drug-free" certificates.

**Awareness Program for Strengthening the Capacity of Combating Postal Drug Trafficking for the Officers of Sri Lanka Post**

The extent of drug trafficking and abuse has become a severe problem in Sri Lanka and it became public health threat that have been identified as utilizing various forms of online marketing and promotion, including social media and some helps to buy drugs. As the current challenge, most of them are delivered to the customers using postal services and other private courier services. Moreover, most of the young people are experimenting with drugs and social networking sites are offering new and dangerous opportunities for adolescents to be exposed to drugs.

The NNL conducted awareness program for the officers of Sri Lanka Post in order to strengthen the capacity on major drug categories, their effects and emerging challenges on drug law enforcement, methods of concealment and new technologies, drug related legislation and regulations, New trends of internet and postal drug trafficking and proceeding with effective evidences collection and Drug Demand Reduction.



## පුරෝගාමී පාලන අධිකාරිය - භූමිකාව

පූර්වජ රසායන සම්බන්ධව ක්‍රියා කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය යටතේ පූර්වජ රසායන අධිකාරිය පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ මාදක සහ මනෝවර්ථක නීති විරෝධී ලෙස නිෂ්පාදනය කිරීමේදී භාවිතා කරන පුරෝගාමී රසායන ද්‍රව්‍ය පාලනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය පාලන ගිවිසුමක් වන 1988 මාදක හා මනෝවර්ථක ද්‍රව්‍ය වල නීති විරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධි විධාන එලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා බලාත්මක අධිකාරිය ලෙස 2008 අංක 1 දරණ මාදක හා මනෝවර්ථක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතියේ 18 වන වගන්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරිය පිහිටුවා ඇත.

පුරෝගාමී රසායනිකයක් යනු වෙනත් සංයෝගයක් නිපදවන රසායනික ප්‍රතික්‍රියාවකට සහභාගී වන රසායන ද්‍රව්‍යයකි. පුරෝගාමී රසායනිකයක් යනු නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මනෝ විද්‍යාත්මක ද්‍රව්‍ය සෑදීම සඳහා භාවිතා කළ හැකි රසායනික ද්‍රව්‍යයකි. එබැවින් එම රසායනික ද්‍රව්‍ය මෙරටට ආනයනය කිරීම, භාවිතය නිරීක්ෂණය කිරීම සඳහා දැඩි යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

### පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයන හා අපනයන අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ පුරෝගාමී රසායන පාලනය සඳහා බලාත්මක අධිකාරිය ලෙස, පුරෝගාමී පාලන අධිකාරිය විසින් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හැකියාව අවම කිරීම සඳහා එවැනි රසායනික ද්‍රව්‍ය අපසරණය වීම වැළැක්වීමේ අරමුණින් පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය, අපනයනය සහ බෙදාහැරීම එලදායී ලෙස අධීක්ෂණය කිරීමේ කටයුතු පහත සඳහන් අයුරින් ඉටුකරනු ලබයි.

- ✓ **බලපත්‍ර නිකුත් කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

- ✓ **පරිශ්‍ර ලියාපදිංචි කිරීම**

පුරෝගාමී පාලන අධිකාරිය විසින් 2008 අංක 1 දරන පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ඕනෑම ද්‍රව්‍යයක් ආනයනය කිරීමට හෝ අපනයනය කිරීමට අයදුම්පත් ඉදිරිපත් කරන පුද්ගලයින් ගේ, එම කටයුතු වලට අදාළ පරිශ්‍රය ලියාපදිංචි කිරීම.

- ✓ **අධීක්ෂණය සහ පරීක්ෂණය**

බලපත්‍රලාභියාගේ ලියාපදිංචි පරිශ්‍රය වරින් වර අධීක්ෂණය කළ යුතු අතර, පනතේ පළමු උපලේඛනයේ I සහ II වගුවේ දක්වා ඇති ද්‍රව්‍ය භාවිතා කරමින් සිදුකරන ක්‍රියාකාරකම්, පුරෝගාමී පාලන අධිකාරිය මඟින් අධීක්ෂණය කිරීම.

**මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියට අනුව පුරෝගාමී පාලන අධිකාරියේ කාර්යභාරය**

මත්ද්‍රව්‍ය අවභාවිතය වැළැක්වීම සහ පාලනය සඳහා වන ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තියේ 2.2 වගන්තියට අනුව, පුරෝගාමී පාලන අධිකාරියට ශ්‍රී ලංකාව තුළ ඵලදායී අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට බලය ඇත.

(අ) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනය සහ අපනයනය සඳහා සහතික සහ අවසර ලබා දීම සහ ගිවිසුම්වල සියලුම අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා 1988 මාදක ඖෂධ සහ මනෝවර්තක ද්‍රව්‍යවල නීතිවිරෝධී ජාවාරමට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියේ 12 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූලව පුරෝගාමී සහ අත්‍යවශ්‍ය රසායනික ද්‍රව්‍ය පිළිබඳ ජාතික පාලනයන් නියාමනය කිරීම හෝ බලාත්මක කිරීම.

(ආ) පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ආනයනය, අපනයනය, ගබඩා කිරීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් පවතින ක්‍රියා පටිපාටි, භාවිතයන්, රෙගුලාසි සහ නීති වරින් වර සමාලෝචනය කිරීම.

(ඇ) බලපත්‍ර අනුමත කරන බලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව පාලනය යටතේ පවතින පුරෝගාමී රසායනික ද්‍රව්‍ය ජාවාරම් කිරීම, හරවා යැවීම සහ අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම ශක්තිමත් කිරීම.

සලකා බලන කාලසීමාව තුළ සේවක සංඛ්‍යාව වැඩි දියුණු කිරීම, 2010 අංක 01 දරන පුරෝගාමී පාලන අධිකාරියේ රෙගුලාසි සංශෝධනය කිරීම, තත්‍යකාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් පිහිටුවීම, මාර්ගගතව හමුවීම් වෙන්කරවා ගැනීමේ විකල්පය වෙබ් අඩවිය හරහා අධිකාරිය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. පුරෝගාමී පාලන අධිකාරිය, බලපත්‍ර නිකුත් කිරීම, පරීක්ෂණ ක්‍රියා පටිපාටිය සහ රසායනික බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

## පාරිභෝගිකයා සම්බන්ධ තොරතුරු හුවමාරුව සඳහා සුහුරු පුරෝගාමී පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම

2008 අංක 01 දරන මාදක සහ මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිවල 19 වැනි වගන්තිය ප්‍රකාරව පාරිභෝගිකයා සම්බන්ධ ගැටලු විසඳීමට සහ පුරෝගාමී පාලන අධිකාරියේ සේවාවන් වඩාත් කාර්යක්‍ෂමව හා ඵලදායී ලෙස කඩිනම් කිරීම සහතික කිරීම සඳහා අධිකාරිය පහත සඳහන් කාර්යයන් නව වශයෙන් ආරම්භ කරන ලදි.

අ. පුරෝගාමී පාලන අධිකාරියේ වෙබ් අඩවිය හරහා මාර්ගගත හමුවීම් වෙන්කරවා ගැනීම, මාර්ගගත බලපත්‍ර තත්ත්ව පරික්ෂාව, බලපත්‍ර හිමියන්ගේ ලැයිස්තුව සමඟ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, බලපත්‍ර අවලංගු කාලසීමාව, පරීක්ෂණ දැනුම්දීම්, මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා විකල්ප සහ නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් සඳහා ප්‍රවේශය ඇතුළු තත් කාලීන තොරතුරු හුවමාරු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, තොරතුරු සත්‍යාපනය කිරීම, ඉල්ලුම්පත්‍ර භාරදීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ පාරිභෝගිකයන් සඳහා තොරතුරු සැපයීම, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ තොරතුරු ගබඩා කිරීමේ පද්ධතියක් හරහා අනෙකුත් තොරතුරු ලබාදීම.

ආ. බලපත්‍ර හෝ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අධිකාරිය විසින් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ආනයනකරු, අපනයනකරු, පරිශ්‍ර, අලෙවිකරු සහ අවසාන පරිශීලකයා ඉදිරිපත් කරන අයදුම්පත් සමග ඉදිරිපත් කරන ලද පිරික්සුම් ලැයිස්තු පුරෝගාමී රසායන ද්‍රව්‍ය දේශීය නිෂ්පාදනය, වෙළඳාම, බෙදාහැරීම සහ අවසන් භාවිතය ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා අයදුම්පත් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.







**ජී. අයි. එස් ගුණසිංහ, එම්. එච්. එම් ගුණසිංහ, පබසරා කහඳවල - (විද්‍යාත්මක නිලධාරී)**

## බාහිර සේවා අංශය

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා අංශය විසින් මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු වලට අදාලව මෙම කාල වකවානුව තුළ සිදු කරනු ලැබූ වැඩසටහන්**

### මන්නාරම වාර්ෂික මඩු මංගල්‍යයට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

මඩු දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යට සමාගමීව බාහිර සේවා අංශය විසින් මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ මන්නාරම අගරදගුරුතුමන්ගේ දායකත්වය ඇතිව විශේෂ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් දින 03 ක් පුරා පවත්වන ලදී. මන්නාරම මඩු දේවස්ථානයට පැමිණෙන බැතිමතුන් වෙළඳ ප්‍රජාව ඇතුළු විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන පැවැත්වුණු අතර සංවර්ධන නිලධාරීන් සහ ස්වේච්ඡා කණ්ඩායම් ද සහභාගීත්වය දක්වන ලදී.







### මහනුවර ඇසළ පෙරහැරට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

මහනුවර වාර්ෂික ඇසළ පෙරහැරට සමගාමීව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා අංශය මගින් දින 10 ක් පුරා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සහ සේවා ප්‍රවර්ධන කුටියක් ඇසළ පෙරහැර භූමියේ පවත්වන ලදී. මහනුවරට පැමිණෙන දෙස් විදෙස් ජනතාව වෙළඳ ප්‍රජාව සහ පෙරහැර සංස්කෘතික කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් මෙම නිවාරණ වැඩසටහන පවත්වන ලදී.





## පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා නායකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම

හොරණ රාජකීය විදුහලේ ජාතික ශිෂ්‍යභට කණ්ඩායමේ නායකත්ව පුහුණු නේවාසික කඳවුරේ සිසුන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් තම පාසල තුළ ප්‍රචලිත කිරීම හා ඒ සඳහා අවශ්‍ය ජීවන කුසලතා සංවර්ධන කිරිම සම්බන්ධව වැඩසටහනක් පැවැත්වීය.

එමෙන්ම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් විසින් තම ප්‍රාදේශීය බල ප්‍රදේශයේ හදුනාගත් පාසල් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදී





## මත්ද්‍රව්‍ය නිවාරණ සම්පත් දායක සංචිත පිහිටුවීම

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පුළුල් පරාසයක් තුළ සිදු කිරිමේ අරමුණින් මත්ද්‍රව්‍ය නිවාරණය, ප්‍රතිකාරය හා පුනරුත්ථාපනය සඳහා ස්වේච්ඡාවෙන් දායකත්වය දක්වන නිලධාරීන්ගෙන් සමන්විත සක්‍රීය කණ්ඩායමක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථාපිත කිරීමට සියලුම බාහිර සේවා නිලධාරීන්ට සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙහි පළමු අදියර ලෙස මේ වන විට බදුල්ල, රත්නපුර, කළුතර, කෑගල්ල යන දිස්ත්‍රික්කයන්වල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක සම්පත් දායක සංචිත පිහිටුවා ඇත.




## මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා කන්තාවන් බලගැන්වීමේ වැඩසටහන හා ස්වේච්ඡා කාන්තා බලකාය පිහිටුවීම

මත්ද්‍රව්‍ය නිවාරණය උදෙසා කන්තාවන්ගේ භූමිකාව ඉස්මතු කර දීම, තම පවුලේ සාමාජිකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම හෝ නතර කිරීම වෙනුවෙන් කාන්තාවකගේ කාර්යභාර්ය හඳුන්වාදීම හා කාන්තාවන් බලගැන්වීම සඳහා වු වැඩසටහනක් මොරටුව බාහිර සේවා නිලධාරිනියගේ සංවිධානයෙන් මොරටුව ප්‍රදේශයේ කාන්තා බලමුළු සාමාජිකාවන් වෙනුවෙන් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා විසින් පවත්වන ලදී

එමෙන්ම රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් විසින් ස්වෙච්ඡා කාන්තා බලකාය මේ වන විට වසම් කීපයකම පිහිටුවා එම බලකායන් සක්‍රීය ලෙස ක්‍රියාත්මක වෙමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා දායකත්වය ලබා දෙනු ලැබේ.





## මාතෘ සායන වෙත පැමිණෙන මව්වරුන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම

බාහිර සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් අනුයුක්ත වී ඇති ප්‍රාදේශීය බල ප්‍රදේශ වල ඇති මාතෘ සායන සඳහා පැමිණෙන මව්වරුන් සහ පියවරුන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම සිදු කරන අතර මෙම වැඩසටහන් මාසිකව සෑම ප්‍රදේශයක් තුලම සිදු කරනු ලැබේ.





## ලංකා තිලක විහාරයේ පෙරහැරට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

මහනුවර ලංකාතිලක විහාරයේ වාර්ෂිකව පවත්වන ලද පෙරහැරට සමගාමී මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සහ මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රදර්ශන කුටිය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ මහනුවර දිස්ත්‍රික් බාහිර සේවා නිලධාරී හා මහනුවර දිස්ත්‍රික් සංවර්ධන නිලධාරීන් විසින් සැප්තැම්බර් මස 27 දින සිට 30 දක්වා පවත්වන ලදී.





## Special prevention campaign parallel to the Jaffana Nallur Kovil annual festival

Outreach team of the National Dangerous Drugs Control Board (NDDCB) conducted a special prevention campaign parallel to the Jaffana Nallur Kovil annual festival with the collaboration of Jaffna district secretariat and Jaffna volunteers. Outreach officers of NDDCB, sisters, fathers, and field officers were joined with the team.

The team has initiated child engagement activities, broadcasting prevention messages through public announcing systems, visualizing prevention video messages through digital screens fixed at open spaces, media discussions on drug prevention and services of NDDCB and conducting pocket meetings.






## Drop-in Center – Redeegama

Outreach unit of the NDDCB has initiated preliminary works to establish a Dropping center for drug dependent persons at Rideegama in collaboration with Rideegama Divisional Secretariat and Ridee viharaya. Field officers of Rideegama DS office, members of civil society organizations are ready contribute voluntarily for the functions of this center. First training program for selected members was held on 14th September at Ridee viharaya with the participation of Assistant Director - outreach, Kurunegala district field officers, officers of Rideegama MOH office, Community police officers and members of civil society organizations.





## Educational Exhibition

Outreach unit of the NDDCB conducted an educational exhibition with the aim of making awareness on adverse health consequences of drug use and motivating students for drug prevention initiatives at Aloysius College, Ratnapura parallel with the 125th Celebration. NGO sector organizations are also joined with the exhibition.





## සබරගමු මහ සමන් දේවාල වාර්ෂික ඇසල උත්සවය සඳහා වූ මත් නිවාරණ ජංගම වැඩසටහන

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ සමන් දේවාල ඇසළ පෙරහැර මංගල්‍යයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එයින් සබරගමු සමන් දේවාල ඇසල පෙරහැර ප්‍රදේශවාසින්ට පමණක් නොව ලක්වාසී සියලු දෙනා හට වැදගත් වේ. පෙරහැර සඳහා විශාල බැතිමතුන් පිරිසක් පැමිණෙන අතර ශිල්පින් හා වෙළඳුන් විශාල පිරිසක් පැමිණෙන අතර ශිල්පින් හා වෙළඳුන් ද සහභාගි විය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වන අප වෙන වසර වලට වඩා සාර්ථකව වැඩසටහන අවසන් කිරිමට හැකි විය. වර්තමානයේ ප්‍රදේශයේ හා රටේ පවතින මත්ද්‍රව්‍ය ගැටලුව පදනම් කරගෙන වැඩසටහන සංවිධානය විය. ඉහත ඉලක්ක කන්ඩායම් සඳහා නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන අවස්ථාවන් ප්‍රජාවට හිමි කර දීමට හැකි විය.

සමන් දේවාල පෙරහැර ආශ්‍රිතව ජංගම වැඩසටහන දින 04ක් පුරාවට පැවති අතර එහිදී දැනුවත් කරන්නට යෙදුණ ප්‍රජාව 17000ක් පමණ වේ. මෙහිදි නිවාරණ වැඩසටහන් සඳහා සම්බන්ධිකරණය සිදු කිරිම,තනි පුද්ගල හා කණ්ඩායම් උපදේශනය සැපයිම සිදු විය.එමෙන්ම වයස අවුරුදු 21කට අඩු දරුවන් සඳහා දුම්කොල ආශ්‍රිත නිෂ්පාදන හා මත්ද්‍රව්‍ය තහනම් බව වෙළඳසැල් හිමියන් දැනුවත් කරන ලදී.









# ප්‍රදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්

## 01. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන - ගාල්ල

ගාල්ල බෝපේ පෝද්දල ජාතික යොවුන් සේනාංකයෙහි පීඨාධිපති මේජර් රංගජීව රත්නායක මහතාගේ ආරාධනයෙන් මත්ද්‍රව්‍ය නිවාරණය සහ තරුණ ප්‍රජාව තේමා කර ගත් දේශනයක් උදෙසා 2023.08.04 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය නියෝජනය කරමින් බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරන වින්දයා එදිරිසිංහ සහ පියුමි සූරිආරච්චි යන නිලධාරීන්ගේ සහභාගී විය.

එහිදී පුරා හෝරා  තුනක් එම තරුණ තරුණියන් සමඟ රැදෙමින් තරුණ ප්‍රජාවගේ මත්ද්‍රව්‍ය භාවිතය, එහි ආදීනව, රටේ අනාගතය උදෙසා ඔවුන්ගේ වගකීම සහ යුතුකම යන ක්ෂේත්‍ර යටතේ කරුණු ඉදිරිපත් කළ අතර කෙටි වීඩියෝ දර්ශන සහ සංගීත රසාස්වාදනයට ද කාලය වෙන් කෙරිණ. අවසන් හෝරාව කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා යෙදවූ අතර ඔවුන් ඉතා උනන්දුවෙන් ඊට සහභාගී විය.









## 02 - கிளை: சமுக சேவை கிளை

1. **நிகழ்வின் பெயர்** : கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழு மீளமைத்தலும், விழிப்பூட்டல் கலந்துரையாடலும்
2. **அமைச்சு ∴ திணைக்களம்** : பாதுகாப்பு அமைச்சு (தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை)
3. **பொறுப்பான உத்தியோகத்தரின் பெயர்** : ச.கணேசதாஸ்
4. **நிகழ்வு நடைபெற்ற இடம்**: கோயில்குளம் கிராம உத்தியோகத்தர் அலுவலகம்
5. **திகதி** : 13.07.2023 **நேரம்** : மு.ப 10.00

**அதிதிகள் வளவாளர்கள் விபரம்** : கிராம உத்தியோகத்தர், பொருளாதார உத்தியோகத்தர், அபிவிருத்தி உத்தியோகத்தர் னேுசுளு, அபிவிருத்தி உத்தியோகத்தர் னேுனுஊடீ

6. **பங்குபற்றுவோர் விபரம்:** சமுக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், பொது மக்கள்

**நிகழ்ச்சி பற்றிய விபரம் :** கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழுமீளமைத்தல் மற்றும், சமுகத்தில் காணப்படுகின்ற போதைப்பொருள் பாவனைக்கு அடிமையானவர்களை, அதிலிருந்து மீட்டெடுத்து, சிகிச்சை மற்றும் புனர்வாழ்வு அளித்தல் தொடர்பாகவும், அதில் 1927 இலக்க தொலைபேசி அழைப்பின் முக்கியத்துவம் தொடர்பாக கிராமிய புத்தெழுச்சி மையக் கூட்டத்தில் விழிப்பூட்டல் செய்யப்பட்டது.



## 03 - கிளை: சமுக சேவை கிளை

1. **நிகழ்வின் பெயர்** : கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழு மீளமைத்தலும், விழிப்பூட்டல் கலந்துரையாடலும்
2. **அமைச்சு ∴ திணைக்களம்** : பாதுகாப்பு அமைச்சு (தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை)
3. **பொறுப்பான உத்தியோகத்தரின் பெயர்** : ச.கணேசதாஸ்
4. **நிகழ்வு நடைபெற்ற இடம்**: புதுக்குடியிருப்பு 151, கிராம உத்தியோகத்தர் அலுவலகம்
5. **திகதி** : 18.07.2023 **நேரம்** : மு.ப 9.30
6. **அதிதிகள் வளவாளர்கள் விபரம்** : கிராம உத்தியோகத்தர், உளவளத்துணை உதவியாளர், அபிவிருத்தி உத்தியோகத்தர் னேுனுஊடீஇ நுனுழு
7. **பங்குபற்றுவோர் விபரம்:** சமுக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், பொது மக்கள்

**நிகழ்ச்சி பற்றிய விபரம் :** கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழுமீளமைத்தல் மற்றும், சமுகத்தில் காணப்படுகின்ற போதைப்பொருள் பாவனைக்கு அடிமையானவர்களை, அதிலிருந்து

மீட்டெடுத்து, சிகிச்சை மற்றும் புனர்வாழ்வு அளித்தல் தொடர்பாகவும், அதில் 1927 இலக்க தொலைபேசி அழைப்பின் முக்கியத்துவம் தொடர்பாக விழிப்பூட்டல் செய்யப்பட்டது.



## 04 - கிளை : சமுக சேவை கிளை

**நிகழ்வின் பெயர்** : கிராம மட்ட போதைப் பொருள் தடுப்பு விழிப்பூட்டல் கலந்துரையாடல்.

1. **அமைச்சு ∴ திணைக்களம்** : பாதுகாப்பு அமைச்சு (தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை)
2. **பொறுப்பான உத்தியோகத்தரின் பெயர்** : ச.கணேசதாஸ்
3. **நிகழ்வு நடைபெற்ற இடம்** : செல்வாநகர் கிழக்கு, பலநோக்கு மண்டபம்.
4. **திகதி** 08.08.2023 **நேரம்** : மு.ப 10.00

**அதிதிகள் வளவாளர்கள் விபரம்** : கிராம உத்தியோகத்தர், அபிவிருத்தி உத்தியோகத்தர் னேுனுஊடீஇ பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர், ீஜ, சமுக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், விவசாய அபிவிருத்தி உத்தியோகத்தர், ளுனுழு

**பங்குபற்றுவோர் விபரம்:** .கிராம மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், பொதுமக்கள்

**நிகழ்ச்சி பற்றிய விபரம்:** கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழுமீளமைத்தல் மற்றும், சமுகத்தில் காணப்படுகின்ற போதைப்பொருள் பாவனைக்கு அடிமையானவர்களை, அதிலிருந்து மீட்டெடுத்து, சிகிச்சை மற்றும் புனர்வாழ்வு அளித்தல் தொடர்பாகவும், அதில் 1927 இலக்க தொலைபேசி அழைப்பின் முக்கியத்துவம் தொடர்பாக கிராமிய புத்தெழுச்சி மையக் கூட்டத்தில் விழிப்பூட்டல் செய்யப்பட்டது.





## 05 - கிளை: சமூக சேவை கிளை

**நிகழ்வின் பெயர்** : கிராமிய புத்தெழுச்சி மையக் கூட்டம், கிராம மட்ட போதைப்பொருள் தடுப்பு குழு மீளமைத்தல், மற்றும் முதியோர் சங்க கூட்டமும், விழிப்பூட்டல் கலந்துரையாடலும்

1. **அமைச்சு ∴ திணைக்களம்** : பாதுகாப்பு அமைச்சு (தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை)
2. **பொறுப்பான உத்தியோகத்தரின் பெயர்** : ச.கணேசதாஸ்
3. **நிகழ்வு நடைபெற்ற இடம்**: கோயில்குளம் - சிகரம் புகலிட மண்டபம்
4. **திகதி** 10.08.2023: நேரம் மு.ப 10.00

**அதிதிகள் ∴வளவாளர்கள் விபரம்** : கிராம உத்தியோகத்தர், ஞஒஒழ உளவளத்துணை உதவியாளர், னுனுஊடீ அபிவிருத்தி உத்தியோகத்தர், நுனுழஇ ஊசீழ.

**பங்குபற்றுவோர் விபரம்:**கிராம உத்தியோகத்தர், ஞஒஒழ உளவளத்துணை உதவியாளர், சமூக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், னுனுஊடீ அபிவிருத்தி உத்தியோகத்தர், நுனுழஇ ஊசீழ

**நிகழ்ச்சி பற்றிய விபரம்:** கிராம மட்ட போதைப்பொருள் தடுப்புக் குழுமீளமைத்தல் மற்றும், சமூகத்தில் காணப்படுகின்ற போதைப்பொருள் பாவனைக்கு அடிமையானவர்களை, அதிலிருந்து மீட்டெடுத்து, சிகிச்சை மற்றும் புனர்வாழ்வு அளித்தல் தொடர்பாகவும், அதில் 1927 இலக்க தொலைபேசி அழைப்பின் முக்கியத்துவம் தொடர்பாக விழிப்பூட்டல் செய்யப்பட்டது. அத்துடன் எதிர்கால சந்ததியினரான சிறுவர்களிடையே நல்லொழுக்கத்தை கட்டியெழுப்புவதில் முதியோர்களின் பங்களிப்பு தொடர்பாக கலந்துரையாடப்பட்டது.





## 06 - கிளை: சமூக சேவை கிளை

**நிகழ்வின் பெயர்** : பிரதேச மட்ட போதைப்பொருள் தடுப்புச் செயலணிக் கூட்டம்.

5. **அமைச்சு ∴ திணைக்களம்** : பாதுகாப்பு அமைச்சு (தேசிய அபாயகர ஔடதங்கள் கட்டுப்பாட்டுச் சபை)
6. **பொறுப்பான உத்தியோகத்தரின் பெயர்** : ச.கணேசதாஸ்
7. **நிகழ்வு நடைபெற்ற இடம்:** மாநாட்டு மண்டபம், பிரதேச செயலகம், மண்முனைப்பற்று.

8. **திகதி : 29.08.2023** **நேரம்** மு.ப 10.00

**அதிதிகள் ∴ வளவாளர்கள் விபரம்** : பிரதேச செயலாளர் திருமதி.ந.சத்தியானந்தி, உதவி பிரதேச செயலாளர் திருமதி.லோகினி விவேகானந்தராஜ், உளநல வைத்திய நிபுணர் னுச.ளு.பரமகுருநாதன், பொறுப்பதிகாரி னுஊனுடீஇ,

**பங்குபற்றுவோர் விபரம் :** ஊசீழுஇ ளுீர்ஜ, கிராம உத்தியோகத்தர்கள், ஆசிரியர்கள், பிரதேச சபை, உளவளத்துணை உதவியாளர், சமுக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள், னுேனுஊடீ அபிவிருத்தி உத்தியோகத்தர்

9. **நிகழ்ச்சி பற்றிய விபரம்:** மண்முனைப்பற்று பிரதேச செயலகப் பிரிவில் காணப்படுகின்ற சட்ட விரோத வடிசாராயம், போதைப்பொருள் விற்பனை மற்றும் அச்சுறுத்தல் தொடர்பாக ஆராயப்பட்டதோடு, இவற்றைக் கட்டுப்படுத்த எதிர்காலத்தில் மேற்கொள்ளப்பட வேண்டிய விடயங்கள் தொடர்பாவும் கலந்துரையாடப்பட்டது.





**07 - நிகழ்ச்சித் திட்டத்தின் பெயர்**

: முதியோர் சங்கக் கூட்டமும், போதைப் பொருள் தடுப்பு விழிப்பூட்டல் கலந்துரையாடலும்.

| | |
|---|---|
| **மாவட்டம்** | : மட்டக்களப்பு |
| **பிரதேச செயலாளர் பிரிவு** | : மண்முனைப்பற்று, ஆரையம்பதி |
| **மாதம்** | : புரட்டாதி - 2023. |
| **உத்தியோகஸ்தர்கள்** | : ச.கணேசதாஸ் |
| **மாதாந்தச் செயற்பாட்டு விபரம்** | : |

**திகதி** : 12.09.2023

**இடம்** : கிராம உத்தியோகத்தர் அலுவலகம், மண்முனை

**நிகழ்ச்சித் திட்டத்தில் கலந்து கொண்டோர் விபரம்** : சமுகசேவை உத்தியோகத்தர், கிராம உத்தியோகத்தர், அபிவிருத்தி உத்தியோகத்தர் னுேனுஊடீஇ ளுனுழுஇ பொருளாதார அபிவிருத்தி உத்தியோகத்தர், சமுக மட்ட அமைப்புக்களின் பிரதிநிதிகள்,

**நிகழ்ச்சித் திட்ட சுருக்கம்** : போதைப்பொருள் பாவனையில் மற்றும், அச்சுறுத்தல்களில் இருந்து தத்தமது குடும்பத்திலுள்ள சிறுவர்களையும், இளைஞர்களையும் எவ்வாறு பாதுகாத்தல் மற்றும்,

மீட்டெடுத்தல் செயற்பாட்டில் முதியோர்களின் பங்களிப்பும், செயற்பாடுகள் தொடர்பாகக் கலந்துரையாடப்பட்டதோடு, பிள்ளைகளுக்கு ஒழுக்க விழுமியங்கள், சிறந்த பண்பாடுகளை எவ்வாறு பழக்கத்திற்குக் கொண்டுவருதல் தொடர்பாகவும், பிள்ளைகளின் பாதுகாப்புத் தொடர்பாகவும் விழிப்புணர்வு செய்யப்பட்டது.





# නවමු උපැස් යුවලකින් ඔබත් ලෝකය දකින්න

ඇත්තටම මිනිසාට උපතින්ම උසස් මනසක් මෙන්න, ඒ හා සමානව තියුණු මසසැක් ද ලබා දී ඇත. ඉතින් අපි අද නවමු, නැතිනම් අලුත් උපැස් යුවලකින් ලෝකය දකින්නේ කෙලෙසද යන්න විමසා බලන කල ආකල්ප (Attitude) ඊට වැඩි දායකත්වයක් ලබා දෙයි. මූලික වශයෙන් ආකල්ප යන්න නිර්වචනය කර ගනිමින් ඒ ඔස්සේ ඉදිරියට මේ සම්බන්ධව විමසා බලමු.

ආකල්ප සම්බන්ධයෙන් එක් එක් සංවිධාන, මනෝවිද්‍යා ගුරුකුල, මනෝ විද්‍යාඥයින් විවිධ අදහස් හා නිර්වචන ඉදිරිපත් කර ඇති අතර පොදුවේ ගත් කළ විවිධ වස්තූන්, සිද්ධීන්, අවස්ථා හා පුද්ගලයන් පිළිබඳ ඇගයීම ආකල්ප වේ. එමෙන්ම විටෙක අවස්ථා, සිද්ධීන්, පුද්ගලයින් හෝ වස්තූන් දකින ආකාරය ආකල්ප නම් වේ. වර්ෂ 1999 දී සිම්බාඩෝ ඇතුලු පිරිස පෙන්වා දුන් ආකාරයට මිනිසුන්, වස්තූන්, සිද්ධීන්, ක්‍රියාකාරකම්, අදහස් හෝ පරිසරයේ ඕනෑ ම දෙයක් පිළිබඳ ප්‍රතිජනනාත්මකව හෝ නිෂේධනාත්මකව ඇගයීම ආකල්ප යැයි අර්ථ දක්වයි. යම් පුද්ගලයෙක් ආකල්ප වස්තූන් (Attitude object) ධනාත්මකව දකිනු ලබයි. ඒ ආකාරයට දකිනු ලබන ආකල්ප ධනාත්මක ආකල්ප (positive attitude) යැයි නම් කරනු ලැබේ. මීට හාත්පසින්ම විරුද්ධව ආකල්ප වස්තූන් ඍණාත්මකව දකින, ඍණාත්මකව අගයන පිරිසක්ද සිටී. ඒ හරහා ඔවුන් අත් දකිනුයේ ඍණාත්මක ආකල්ප (Nagative attitude) වේ. සමස්තයක් වශයෙන් ගත් කළ ඉහතින් සඳහන් කරනු ලැබූ කුමන ආකාරයකින් හෝ පුද්ගලයා තමා අවට පරිසරය, සමාජය, ලෝකය දෙස බලනු ලබයි. එබැවින් සමස්ත පුද්ගලයා කෙරෙහි මෙකී ආකල්ප ඍජුවම බලපානු ඇත. එබැවින් කිසිම පුද්ගලයෙකුට ආකල්ප යන කාරණය බැහැර කළ නොහැකි ජීවිතානු බද්ධ සංකල්පයකි. නමුත් අප දන්නා පොදු කාරණය වනුයේ පුද්ගලයාට තම ජීවන කාල සීමාව තුළ අත් දකින සියල්ල පිළිබඳ ධනාත්මක ඇසකින් දැකීමට තරම් හැකියාවක් නොමැති බවයි. මන්ද යත් අප සියලු දෙනාම පෘථංජනයින් වන බැවිනි. (සබ්බේ පෘථංජනා උම්මත්තකා) ආකල්ප සම්බන්ධව ආගමික දෘෂ්ටි කෝණයෙන් බලන කල්හී බුදුරදුන් පෙන්වා දුන් මධ්‍යස්ථ ප්‍රතිපදාව අනුසාරයෙන් මෙය විග්‍රහ කිරීමේදී පූර්ණ වශයෙන් ධනාත්මක ආකල්ප මෙන්ම ඍණාත්මක ආකල්ප නොවන මෙකී ද්විත්වයටම පොදුවේ මධ්‍යස්ථ ආකල්පයකින් යුක්තව ලෝකය දෙස බැලීමට අප කටයුතු කළ යුතුය.

මේ ආකාරයට ආකල්ප සම්බන්ධව මුලික විග්‍රහය සිදු කිරීමෙන් අනතුරුව අපි ආකල්ප වර්ග (Types of attitudes) පිළිබඳ අවදානය යොමු කර බලමු. මනෝවිද්‍යා විෂය පද්ධතිය තුළ සිටිමින් සමාජ මනෝවිද්‍යාඥයින් මූලික වශයෙන් ආකල්ප කොටස් තුනකට බෙදා වෙන් කරනු ලබයි. එනම්,

1. ආවේදනාත්මක ආකල්ප (Affective attitudes) - මෙහිදී ආකල්ප වස්තුව කෙරෙහි කිසියම් හැඟීමක්, චිත්තවේගයක් හෝ වටිනාකමක් මත සැකසෙන ආකල්ප මේ ඝනයට අයත් වේ. උදාහරණ වශයෙන් ප්‍රාණඝාතය සම්බන්ධයෙන් පුද්ගලයා දරන මතය පෙන්වා දිය හැකිය.

2. ප්‍රජානාත්මක ආකල්ප (Cognitive attitudes) - ආකල්ප වස්තුව මුලික කර ගනිමින් ඒ ඔස්සේ ගොඩ නැගෙන සිතුවිලි, විස්වාස හා දැනුම මත සැකසෙන ආකල්පයන්ය. මෙකී ආකල්පයෙහි මූලික

අරමුණ වනුයේ, යම් කිසි දෙයක හොඳ හෝ නරක වෙන් කර හඳුනා ගැනීමයි. එහිදී පුද්ගලයා උපත ලැබූ අවස්ථාවේ සිට මේ දක්වා රැස් කර ගන්නා දැනුම මත මෙම ආකල්ප නිර්මාණය වේ.

3. චර්යාත්මක ආකල්ප (Behavioral attitudes) - චර්යාත්මක ආකල්ප යනුවෙන් පෙන්වා දෙනු ලබන්නේ ආකල්ප වස්තුවක් කෙරෙහි ඉදිරිපත්වන ක්‍රියාවන් හෝ චර්යාව හෙවත් හැසිරෙන ආකාරය පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් ඇති වන ආකල්පයන්ය. උදාහරණ වශයෙන් රටක ජනාධිපතිවරයෙකුගේ හැසිරීම නිරීක්ෂණය කිරීම මගින් ඔහු පිළිබඳ චර්යාත්මක ආකල්පයක් ගොඩ නගා ගැනීමට අපට හැකි වනු ඇත.

සමස්තයක් වශයෙන් ගත් කළ ආකල්ප සාධනය කෙරෙහි මෙකී අංශ තුනෙහිම සහභාගීත්වය අවශ්‍ය වේ. මෙකී අංශයන් ත්‍රිත්වයටම පොදුවේ උදාහරණයක් සැපයීමේ දී තරුණයෙකු හා තරුණියෙකු අතර ඇති වන ප්‍රේම සම්බන්ධයක් ආශ්‍රයෙන් මෙය පෙන්වා දිය හැකිය. එහිදී තරුණිය සම්බන්ධයෙන් තරුණයා තුළ හට ගනු ලබන ප්‍රේමය, චිත්තවේග, අනුකම්පාව වැනි හැඟීම් ආවේදනාත්මක අන්තර්ගතය පෙන්වා දෙනු ලබයි. එමෙන්ම තරුණිය සම්බන්ධයෙන් තරුණයා තුළ ගොඩ නැගෙන විශ්වාසය, ඇය සමග ජීවිතයේ දිගු ගමනක් යා හැකි බව ආදී සියල්ල ප්‍රජානනාත්මක අන්තර්ගතය වේ. අවසාන වශයෙන් ඇය විවාහ කර ගැනීම,ඒ සඳහා සූදානම් වීම යන්න චර්යාත්මක අන්තර්ගතය වේ.

මේ ආකාරයට අවසාන වශයෙන් ආකල්ප සම්බන්ධයෙන් පෙන්වා දිය හැකි සරලම කාරණය වනුයේ, පුද්ගලයා ඔහු උපත ලැබූ අවස්ථාවේ පටන් මරණය දක්වා එක් රැස් කරගන්නා දැනුම මත ආකල්ප ගොඩ නගා ගන්නා බවත්, එහිදී ගොඩ නැගෙන ආකල්ප විටෙක ධනාත්මක මෙන්ම විටෙක ඍණාත්මක ආකල්පයක් ද විය හැකිය. එය එක් එක් පුද්ගලයාට අනන්‍ය වූ ආකාරයට බලපානු ලබයි. නමුදු ආගමානුසාරයෙන් බලන කල සියල්ල දෙස මධ්‍යස්ථ දෘෂ්ටි කෝණයකින් බලන්නනේ නම් පුද්ගලයාට කිසිදු ආතති කාරකයකට මුහුන දීමට සිදු නොවනු ඇත. එනම් ඒ හරහා පුද්ගලයාට නවමු දෘෂටි කෝණයකින් ලෝකය දෙස බැලීමට ඉඩ හසර ලැබෙනු ඇත. ආකල්ප සම්බන්ධයෙන් ඇති සුප්‍රසිද්ධ කියමනකින් ලිපිය අවසන් කරන්නේ නම්..... “ආකල්ප යනු පුංචි දෙයක්, එයට විශාල වෙනසක් කිරීමට හැකියාව ඇත”. (Attitudes is a little thing,that can make a big difference)



**ධනුෂ්ක එස් විජේසිංහ - බාහිර සේවා නිලධාරී**

## මල් විකසිත වීමට නියමිතයි....

අතුපතර විහිද ගිය, මහා පතාක ගස්වල, සෙලවෙන අඳුරු සෙවණැලි වැටී තැනින් තැන අද්භූත දසුන් මැවූ තාර ඇතිරූ ප්‍රධාන මාර්ගය පාළු, මූසල ස්වාභාවයක් ඉසිලී ය. තාර පාර සිට ඉහළ බලන්නෙකුට ආකාහේ නොපෙනෙන තරමට ම පතාක ගස්වල අතු, අහස අරා පැතීරී ගොස් තිබුණේ හාත්පස ම තව තවත් අඳුරෙහි, මුස්පේන්තු බවෙහි ගිල්වමිනි. පුන් සඳ නැගී නොබෝ දිනක් ගතව ගොස් තිබූ බැවින්, අහස කොණක පෑයූ චන්ද්‍රයා ගේ ආලෝකය යන්තමින්වත් අඳුරු කාපට් මාර්ගය සිප නොගත්ත තරමකි. තැනින් තැන වූ විදුලි පහන්, කණා මැදිරි එළි වන් ආලෝක පුංජයන් එක් කළ ද මධ්‍යම රාත්‍රිය ද පසුවී තිබූ මේ අඳුරු වේලාවෙහි එම අලෝක සුගිත්තෙන් පියවී ඇසට යමක් පෙනෙන නොපෙනන තරම්. වීදියේ කොණක නියෝන් ආලෝක පහන් අඩ වශයෙන් දැල් වුණු කුඩා වෙළඳ දැන්වීම් පුවරුවක් සහිත කුඩා  කඩයක් වුව ද, එය ද පාළුවට ගොස් තිබූ සේයාවක් දක්නට ලැබිණි. අඳුර රජයමින් තිබූ මාර්ගය දිගට මිනිස් පුළුටක් ඇති බවක් දක්නට නොවීය. එහෙත් තනි එල්ලයට පුළුල් ව, ඉදිරියට ඇඳුණු කඩතොළු රහිත කාපට් ඇතිරූ ප්‍රධාන මාර්ගය දෙපස සැළකිය යුතු මට්ටමින් පුළුල් වූ, පදික වේදිකාව මත කේඩෑරී වී ගිය, නහර උඩට ඉල්පී ඇට පෑදුණු පා යුගලක් කලබලයෙන් විටෙක දුවමින්, විටෙක නැවතෙමින්, තවත් විටෙක ඉක්මන් අඩියෙනුත් ගමන් කරනු ලැබූව ද, පාළු - අඳුරු, පාර දෙස උවමනාවෙන් ම මිස, ඉක්මන් බැලුම් හෙළූ දෙනෙතකට නම් ඒ හසු නොවන්නේ ය. හොඳින් ඇහුම්කන් දෙන සවනකට මිස තාර මත අහම්බයකින් මිසක නිතර නොතිබු බොරළු කැටයක් එම පාද වලට හසුවන හඬ ද හසු නොවන්නේ ය. මාර්ගය ඒ තරමට ම පාළු ය. අඳුරු ය. පාෂාණීභූත ය.

මෙසේ ඉදිරියට නිනව්වක් නොමැතිව ඇදෙන සැකිලි පාද දෙක නොසන්සුන් ය. ක්ෂය රෝගියෙකු මෙන් උඩට අදින සුස්ම ද ඇති ය. විටෙක තණකොළ ගොල්ලක් මෙන් විසිරී කසඩව තිබූ සිය කෙස් වැටියම සිය දෙඅතින් අදිමින් මෙකී පුද්ගලයා හති නිවයි, නවතියි.  ආයෙමත් කෙටි දුරක් අඩ්ඩඩ්ඩාවට දිව යයි. දිවෙන විට කකුල් පැකිලෙයි. යටි පතුල් ගොරගැඩිව පතුල් ඉරි තළා පැලී ගොසිනි. දුර්වල පාද අවිශ්වසනීය පියවර තබමින් ඉදිරියට ඇදී මද වේලාවකින් ප්‍රධාන මාර්ගය දෙපසකට විහිද යන "ඔ" හැඩයේ මං සන්ධියක් වෙත ළඟා වී ය. එතැන අඳුරු මුල්ලකට වන්නට ඇති විශාල කඳක් සහිත මාර ගසක් පාමුල, පදික වේදිකාව දෙපළු කරමින් උඩට නැඟුණු විශාල මුලක් මත හිඳ ගත් කෙඩෑරී දෙපා සහිත පුද්ගලයා තමාට ඉදිරියෙන් ඇති මාර්ගයෙහි කුමන දිශාවට විහිද ගිය මාර්ගයෙහි ගමන් ගන්නේදැ'යි අවිනිශ්චිතභාවයකින් යුතුව, අතීරණයකින් යුතුව බලා හිඳින්නට විය. එවිටම වාගෙ යම් අඳුරු දැහැනකින් මිදුණාක් වැනි ව ඔහුගේ පසු පසින් තමා දෙසට ඇදුණු සපත්තු හඬක් ඔහුට ඇසෙන්නට වණ ම, ඔහුගේ උරහිසට අත තබමින්,

"ඇයි මල්ලි අතරමං වෙලා ද?"


යැ'යි ගැඹුරු නමුත් මිත්‍රශීලී පිරිමි කටහඬක් විසින් ඔහුහෙන් අසනු ලැබූයේ, ඔහු කර ඔසවා පිටුපස බැලීමට බෙල්ල හරවනවාත් සමඟ ම ය. ඔහු එවිට දුටුවේ ප්‍රසන්න මුහුණක් ඇති සිත් ගන්නා සිනහාවකින් සැරසුණු, ආරෝහ පරිනැහ දේහයකින් යුත් කඩවසම් පුරුෂයෙකි. හෙතෙම කෘෂ පාදැති ඔහු , උත්තර දීමට මුව විවර කිරීමට උත්සාහ ගත්ත ද, වචන පිට නොවී ය. ඔහුට ම පුදුම ය. තමා තනිව ගමන් ගත් පාළු අඳුරු මාර්ගයෙහි තමාට අවැසි මොහොතේ ම මෙසේ පැමිණ තමාට මඟ වැරදී

ඇත්දැ'යි මොහු විමසීම අරුම සහගත ය. හේ ඔහුගෙන් පිළිතුරක් බලාපොරොත්තු නොවීය.  ඔහුට මග වැරදී ඇති බැවි, තත්පර කිහිපයක් ඔහුගේ දෑස දෙස බලා සිටි ආරෝහ පරිණාහ තරුණයාට සිය, සිඳී ගොස් ගිලී තිබූ කළු ආවාටැති, දෙඇස් විසින් පිළිතුරු දෙන්නට ඇතැ'යි කෘෂ පාදැතියා දත්තේ ය. ඔහු මද සිනාපෑ ය.

" එන්න මල්ලි මං පෙන්වන්නම් පාර" යැ'යි කියමින් මිත්‍රත්වයේ හස්තයක් ඔහුගේ කර වටා දමා ගත් කඩවසම් තරුණයා ඔහු සමග ඉදිරියට ඇදෙන්නට විය.

තණකොළ මතට තුහින බිඳු වැටී තණමල් පොහොට්ටු , සුසර කළ පසු අරුණාලෝකය සිප ගනිමින් තණමල් පිපෙනු ඇත. තණමල් පිරිවරා තැනින් තැන දක්නට ඇති මදක් උස් ව වැඩී ගිය නත්තනසූරිය මල් ද හිරු සමග උපත ලබනු ඇත.

මත්ද්‍රව්‍ය ඔබට ඔබ අහිමි කරනු ඇත. මල් වලට පිබිදීම ට අමතක කරනු ඇත. නමුත් ස්වභාව ධර්මයාට අවනත වෙමින් දිනෙක මල් විකසිත වීමට නියමිත ය.




**රසාංගි චන්ද්‍රසිරි -  උපදේශන නිලධාරී**

# NDDCB ප්‍රතිකාර මධ්‍යස්ථාන



**Kandy**

"Kandy" Youth Prevention,
Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa,
Peradeniya
Tel : +94 81 2315504




**Nawadiganthaya**

"Nawadiganthaya" Prevention,
Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



**Talangama**

"Talangama" Prevention, Treatment &
Rehabilitation Center
172, Shanthi Mawatha, Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk



**Galle**

"Galle" Prevention, Treatment &
Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk